# GMOA

ESTABLISHED IN 1926
TU No. 291

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk


01/10/2012

**මාධ්‍ය නිවේදනයයි.**

**සහකාර සහ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන්ට, රියදුරු බලපත්‍ර සඳහා අවශ්‍ය වෛද්‍ය පරීක්ෂණ සහතික පත් නිකුත් කිරීමේ බලතල ලබාදීම පිලිබඳවයි.**

රියදුරු බලපත්‍ර ලබා ගැනීමට අත්‍යාවශ්‍ය වෛද්‍ය පරීක්ෂණ සහතිකපත් නිකුත් කිරීමේ බලතල සහකාර වෛද්‍ය නිලධාරි සහ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන්ට ප්‍රවාහන අමාත්‍යාංශය මඟින් ලබා දී තිබේ. ප්‍රවාහන පනත අනුව එම වෛද්‍ය සහතික නිකුත් කිරීමේ බලතල ඇත්තේ උපාධිධාරී වෛද්‍යවරයකුට පමණි. ප්‍රවාහන අමාත්‍යාංශයේ ඉහත තීරණය මඟින් ප්‍රවාහන පනත උල්ලංඝණය කර ඇත. මෙම කරුණ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මඟින් ද ප්‍රවාහන අමාත්‍යාංශයට මීට ඉහතදී දන්වා තිබේ.

තවද රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ මූලික සුදුසුකමක් වන වෛද්‍ය පරීක්ෂණයේ ගුණාත්මකභාවය රැක ගැනිම දිනෙන් දින වැඩි වන මාර්ග අනතුරු පාලනය කිරිම සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. නමුත් මෙම පරීක්ෂණ සිදු කිරීමේ බලතල ලියාපදිංචි සහ සහකාර වෛද්‍ය නිලධාරීන්ට ලබා දීම රියදුරු බලපත්‍රයේද ගුණාත්මකභාවය පහත හෙලීමක් බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ අදහසයි.

මේ නිසා ප්‍රවාහන අමාත්‍යාංශය මඟින් ගෙන ඇති මෙම අත්තනෝමතික තීරණය වහා වෙනස් කර මෙතෙක් කල් පැවති ආකාරයට රියදුරු බලපත්‍රය සඳහා අවශ්‍ය වෛද්‍ය පරීක්ෂණය සිදු කිරීම උපාධිධාරී වෛද්‍ය නිලධාරීන් විසින් පමණක් සිදුකල යුතු බව අප අවධාරණය කරමු.

ස්තූතියි

වෛද්‍ය නලින් ආරියරත්න
සහකාර ලේකම්

වෛද්‍ය නලින් ආරියරත්න 0714800942
වෛද්‍ය නවීන් ද සොයිසා 0718582444